# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1801/40 - 2013 මාර්තු මස 15 වැනි සිකුරාදා - 2013.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/13/12/2010.

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය**

අංක 1739/14 දරන හා 2012.01.04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් මාතර, වල්ගම, අලුත්වත්ත හි පදිංචි ජේ. ඒ. සුජිත් පුෂ්ප කුමාර මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 03, ගාලු පාර, අංක 234, මාරිටයිම් සෙන්ටර්, මාස්ටර් ඩයිවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි පදිංචි (පැල්වත්ත සීනි කර්මාන්තායතනයෙහි සභාපතිව හා මුණ්ඩා ගැස් (පුද්ගලික) සමාගමේ අයිතිකරුව සිටි) සභාපති, ආරියසීල වික්‍රමනායක මයා අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 3390 දරන හා 2011.11.30 දිනැති ප්‍රදානය අවලංගු කරන ලෙසට ආරියසීල වික්‍රමනායක මයා වෙතින් කාර්මික ආරවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 3390 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2013.04.22 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(අ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2013 පෙබරවාරි මස 21 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

**'අ' ආකෘති පත්‍රය**

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ආරියසීල වික්‍රමනායක,
මැරිටයිම් සෙන්ටර්,
අංක 234,
ගාලු පාර, කොළඹ 3.
2012.03.09

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය,

2012.01.04 දිනැති සහ 1739/14 දරන ගැසට් පත්‍රයේ පල කරන ලද්දා වූ ආරියසීල වික්‍රමනායක සහ ජේ. ඒ. සුජිත් පුෂ්පකුමාර බැදී සිටින්නා වූ ද 2012.01.04 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පිටපත -

ජේ. ඒ. සුජිත් පුෂ්පකුමාර,
අලුත්වත්ත,
වල්ගම,
මාතර.

03 - 1172

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1 A – G 17435 — 350 (2013/03)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.